සියලුම හිමිකම් ඇවිරිණි /All Rights Reserved

# Royal College - Colombo 07
## රාජකීය විද්‍යාලය - කොළඹ 07

**Grade 9 - Diagnostic Test – September 2022**

අනාවරණ පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2022 සැප්තැම්බර්

කාලය : පැය 1
Time: 1 hour

## විද්‍යාව

Name: - ........................................................ class: -................. Index no: - ......................

1 කොටස

වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

1. වායුගෝල නයිට්‍රජන් තිර කිරීමට දායක වන ක්ෂුද්‍ර ජීවියා වනුයේ,
   (1) වෛරස් (2) රයිසෝබියම් (3) පැරමීසියම් (4) ඇමීබා

2. ඇසේ ඇති කාචය,
   (1) වක්‍රතාවය වෙනස් කළ නොහැකි කාචයකි. (2) වක්‍රතාවය වෙනස් කළ හැකි කාචයකි.
   (3) පාරදෘශ්‍ය නොවන කාචයකි. (4) ද්වි අවතල කාචයකි.

3. ද්වි නේත්‍රික දෘෂ්ටිය හොඳින්ම පෙන්වන සත්වයකි.
   (1) ගවයා (2) මිනියා (3) බල්ලා (4) ගොනා

4. කර්ණපටහ පටලයෙහි දෙපස පීඩනය සමානව පවත්වාගෙන යාමට උපකාරී වන අවයවය නම්,
   (1) යුස්ටේකීය නාළය (2) කර්ණ අස්ථිකාය (3) ශ්‍රවණ ස්නායුව (4) බාහිර ශ්‍රවණ නාලය

5. මිනිස් කනෙහි ශ්‍රව්‍ය සංඛ්‍යාත පරාසය වන්නේ,
   (1)20Hz-2000Hz (2) 20Hz - 200Hz (3) 20000 Hz - 2Hz (4) 20Hz - 20000Hz

6. Na යන සංකේතයෙන් දැක්වෙන මූලද්‍රව්‍ය කුමක්ද?
   (1) කැල්සියම් (2) සල්ෆර් (3) සෝඩියම් (4) සින්ක්

7. මෙම රූපයේ පෙන්වා ඇත්තේ වස්තුවක් මත 10N බලයක් යොදන ආකාරයයි.
   මෙහි උපයෝගී ලක්ෂය පෙන්වා ඇති අක්ෂරය වන්නේ,




   (1) P ය (2) K ය (3) Y ය (4) L

8. අඩු බලයක් යොදා සබන් කැටයක් පහසුවෙන් කැපීමට යොදාගත හැකි කම්බිය වන්නේ,




   (1) D ය (2) C ය (3) A ය (4) B ය

9. 




200N ක් බර ඝනකාභ හැඩැති ලී කුට්ටියක් මේසයක් මත තැබුව හොත් වැඩිම පීඩනයක් යෙදෙන්නේ,

   (1) A පැත්තෙන්ය (2) B පැත්තෙන්ය
   (3) C පැත්තෙන්ය (4) A හා B හා C පැතිවලින් එකම පීඩනයක් යෙදේ.

10. $CuSO_4$ යන සංයෝගයේ ඇති මූලද්‍රව්‍ය ගණන,
   (1) 4කි (2) 3කි (3) 6කි (4) 5කි



Download more papers at e-Kalvi.com

11. $^{35}_{17}Cl$ යන මූලද්‍රව්‍ය පරමාණුවේ ඇති ඉලෙක්ට්‍රෝන, ප්‍රෝටෝන, නියුට්‍රෝන ගණන පිළිවෙළින්,

(1) 17 17 19 (2) 17 17 15 (3) 17 35 17 (4) 17 17 18

12. 10 kg ක බර වන්නේ,

(1) 100N (2) 1000N (3) 10N (4)1N

13. 1Pa යන පීඩනයට සමාන පීඩනයක් දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) $10NM^{-2}$ (2) $1NM^{-2}$ (3) $0.1NM^{-2}$ (4) $100NM^{-2}$

14. හෘදයක කුටීර හතර පහත දක්වා ඇත.




D වලින් දක්වා ඇති රුධිර නාලය,

(1) පූර්ව මහා ශිරාව (2) අපර මහා ශිරාව
(3) සංස්ථානික මහා ධමනි (4) පුප්ඵුෂීය මහා ධමනි

15. රුධිරයේ ආරක්ෂක කෘත්‍ය ඉටු කරන රුධිර සෛල වර්ගය වන්නේ,

(1) රතු රුධිරාණු සෛල (2) සුදු රුධිරාණු සෛල (3) රුධිර පට්ටිකා (4) රුධිර ප්ලාස්මාව

16. සර්ව දායක රුධිර ගණය වන්නේ,

(1) A ය (2) B ය (3) AB ය (4) O ය

17. එකම කුලයට අයත් පදාර්ථ දැක්වෙන පිළිතුර වන්නේ,

(1) සෝඩියම්, කාබන්, ඔක්සිජන් (2) ඔක්සිජන්, ජලය, වාතය
(3) ජලය, කාබන්, සෝඩියම් (4) වාතය, කාබන්, ඔක්සිජන්

18. සමජාතීය මිශ්‍රණය තෝරන්න.

(1) ලුණු ද්‍රාවණය (2) සිමෙන්ති බදාම (3) කලතූ ජලය (4) බොර ජලය

19. පෙට්ටිය ඉදිරියට තල්ලු කිරීමට බලය යෙදිය යුතු හොඳම ස්ථානය වන්නේ,




(1) A (2) D (3) C (4) B

20. පදාර්ථය නිර්මාණය වී ඇති තවදුරටත් බෙදිය නොහැකි කුඩාම අංශුව,

(1) පරමාණුව (2) අණුව (3) මූල ද්‍රව්‍ය (4) සංයෝගය

( ලකුණු 1x 20=20)

## 11 කොටස

කෙටි පිළිතුරු ලියන්න.

21. ජීවී ලක්ෂණ මෙන්ම අජීවී ලක්ෂණ පෙන්වන ක්ෂුද්‍ර ජීවී කාණ්ඩය කුමක්ද? ....................

22. ජෛව පොහොර ලෙස යොදා ගන්නා බැක්ටීරියාවක් සඳහන් කරන්න. ....................

23. ජීව වායුව නිපදවීමේ දී සිදු වන ශ්වසන ක්‍රමය කුමක්ද? ....................

24. ලෙහෙම් ඇති කරන ක්ෂුද්‍ර ජීවී කාණ්ඩ සඳහන් කරන්න. ....................

25. ළඟ පිහිටි වස්තු පැහැදිලිව පෙනෙන නමුත් දුර වස්තු පැහැදිලිව නොපෙනෙන දෝෂය කුමක්ද?

....................

26. ග්ලූකෝමාව රෝගයේ දී හානි සිදුවිය හැකි ඇසේ අවයවය කුමක්ද? ....................

27. අර්ධ චක්‍රාකාර නාලවල වැදගත්කම කුමක්ද? ....................

28. නිර්ජලීය කොපර් සල්ෆේට්වල පාට කුමක්ද? ....................

29. පරමාණුවක න්‍යෂ්ටියේ ප්‍රෝටෝන 12ක්ද, නියුට්‍රෝන 13ක්ද ඇති නම් එහි පරමාණුක ක්‍රමාංකය කීයද?

....................

30. මුහුදු ජලයෙන් ලුණු ලබා ගැනීමේදී භාවිත කරන විශේෂිත භෞතික ක්‍රමය කුමක්ද?

....................

31. සංඝටක දෙකක් හෝ ඊට වඩා වැඩි ගණනක් සමන්විත වූ භෞතික ක්‍රම මඟින් වෙන්කර ගත හැකි වූ පදාර්ථ පොදුවේ කුමන නමකින් හඳුන්වයිද? ....................

32. 100N බලයක් $2m^2$ වර්ගඵලයක් තුළින් තවත් වස්තුවකට යොදා ඇති විට ඇතිවන පීඩනය කොපමණද?

....................

33. ධමනියක් බෙදීමෙන් සෑදෙන කුඩා රුධිර නාල වර්ගය කුමක්ද? ....................

34. ඩෙංගු, මී උණ ආදී රෝගවලදී සීඝ්‍රයෙන් පහළ බසින රුධිර සංඝටකය කුමක්ද?

....................

35. A රුධිර ගණය ඇති තැනැත්තෙකුට රුධිරය ලබාදිය හැක්කේ කුමන රුධිර ඝන පවතින අයටද?

....................

36. හෘදයෙන් ඉවතට රුධිරය ගෙන යන රුධිර නාල හඳුන්වන පොදු නම කුමක්ද?

....................

37. දකුණු කර්ණිකාවක් වම් කර්ණිකාවත් අතර ඇති කපාට වර්ගය කුමක්ද? ....................

38. සල්ෆර්(ගෙන්දගම්) කැබැල්ලක පැහැය සඳහන් කරන්න....................

39. ඇස මඟින් වස්තුවක උස, ගැඹුර හා වස්තුවකට ඇති දුර හඳුනා ගැනීමේ හැකියාව කුමන නමකින් හඳුන්වයිද?

....................

40. අන්වීක්ෂයක උප නෙත් කාචය උත්තල කාචයක්ද? අවතල කාචයක් ද යන බව සඳහන් කරන්න.

....................(1x 20= 20)



Scanned by TapScanner

පහත රූප සටහන් වලින් දක්වා ඇති කොටස් හඳුනාගෙන නම් කරන්න

41) 


A -

42) 


B- ......................................

43) 


C- ......................................

44) 


D ......................................

45) 


E-

46) 


F- ......................................

47)




G - ......................................

48)




H - ......................................

49)




I - ......................................

50)




J - ......................................

(2 x 10 =10)



Scanned by TapScanner